## ව්‍යවසායකත්ව අධ්‍යයනය I, II

**11 ශ්‍රේණිය** **අවසාන වාර පරීක්ෂණය - 2016**

### ව්‍යවසායකත්ව අධ්‍යයනය I

### ලකුණු දීමේ පටිපාටිය

| | | | |
|---|---|---|---|
| 01 | (2) | 21 | (1) |
| 02 | (4) | 22 | (2) |
| 03 | (3) | 23 | (1) |
| 04 | (3) | 24 | (1) |
| 05 | (1) | 25 | (3) |
| 06 | (3) | 26 | (2) |
| 07 | (3) | 27 | (3) |
| 08 | (2) | 28 | (1) |
| 09 | (1) | 29 | (3) |
| 10 | (2) | 30 | (2) |
| 11 | (2) | 31 | (2) |
| 12 | (3) | 32 | (3) |
| 13 | (2) | 33 | (4) |
| 14 | (3) | 34 | (2) |
| 15 | (2) | 35 | (3) |
| 16 | (1) | 36 | (2) |
| 17 | (4) | 37 | (2) |
| 18 | (4) | 38 | (3) |
| 19 | (1) | 39 | (4) |
| 20 | (1) | 40 | (2) |

## ව්‍යවසායකත්ව අධ්‍යයනය II

## ලකුණු දීමේ පටිපාටිය

01. (i) ව්‍යාපාරවල ක්‍රියාකාරිත්වයට ව්‍යාපාර අභ්‍යන්තරයෙන් මෙන් ම බාහිර ව ධනාත්මක හා ඍණාත්මක වශයෙන් බලපෑම් ඇති කරන සාධක හා බලවේග සියල්ල ව්‍යාපාර පරිසරය වේ.

(ii)
- ★ ව්‍යාපාර පරිසරයේ වෙනස්කම් හඳුනාගෙන ඒ සඳහා නිසි ප්‍රතිචාර දැක්වීමෙන් ව්‍යාපාර කටයුතු පහසුවෙන් හැසිරවිය හැකි වීම
- ★ වර්තමානයේ වෙළෙඳපොල මුල් කරගත් ආර්ථිකයක් ඇති ශ්‍රී ලංකාවේ ව්‍යාපාර පරිසරය තුළ ඇති වෙනස්කම් හඳුනාගෙන ඒවා අධ්‍යයනය කිරීමෙන් නිර්මාණශීලි ව්‍යාපාර අදහස් සහ අවස්ථා රාශියක් විවිධ පරිසර ක්ෂේත්‍ර තුළින් මතු කරගත හැකි වීම
- ★ ගුණාත්මක ව්‍යාපාර සංස්කෘතියක් ගොඩ නැගීමට දායක වන ව්‍යවසායකයන්ගේ පැවැත්ම තහවුරු කරගැනීමට ව්‍යාපාර පරිසරය ඉතා හොඳ පදනමක් සැපයීම
- ★ හිතකර බලපෑම් හඳුනාගෙන ඒ තුළින් ව්‍යාපාර තව තවත් ශක්තිමත් කරගැනීමට ව්‍යවසායකයා කටයුතු කළ යුතු අතර අහිතකර බලපෑම් හඳුනාගෙන ඒවා අවම කරගැනීම සඳහා පිළියම් යෙදිය හැකි වීම

**කරුණු දෙකක් ඇතුළු පැහැදිලි කිරීමට ලකුණු ලබාදෙන්න.**

(iii)
- ★ අයිතිකරුවන්
- ★ කළමනාකරුවන්
- ★ සේවකයෝ
- ★ සම්පත්

(iv)
- ★ ප්‍රාථමික අංශය
- ★ ද්විතීයික අංශය
- ★ තෘතීයික අංශය

(v)
- ★ නව ආදායම් මාර්ග සකස් කරගැනීමේ හැකියාව වැඩි කරගැනීම සඳහා
- ★ වෙළෙඳපොල තුළ තරගකාරිත්වයට සාර්ථක ව මුහුණ දීම සඳහා
- ★ පරිසරය තුළ මෙතෙක් ප්‍රයෝජනයට නොගත් සම්පත් භාවිතා කිරීමට
- ★ සාර්ථක ව්‍යාපාරික අවස්ථා ග්‍රහණය කරගැනීම සඳහා
- ★ පාරිසරික ගැටලු අවම කරගැනීමට
- ★ අර්ථ ක්‍රමය තුළ අවශ්‍යයෙන් ම ඉටු කරගත යුතු සංවර්ධන ක්‍රියාදාමයන් මතු කරගැනීමට
- ★ ආවේනික සම්පත් සුරැකීම සහ අනාගතය සඳහා ඉතිරි කිරීම

**ප්‍රයෝජන 4 ක් ඇතුලත් ව පැහැදිලි කිරීම්වලට ලකුණු ලබාදෙන්න.**

02. (i)
- ★ සුළු පරිමාණ ව්‍යාපාර
- ★ මධ්‍යම පරිමාණ ව්‍යාපාර
- ★ මහා පරිමාණ ව්‍යාපාර

(ii)
- ★ ව්‍යාපාරික කටයුතු සඳහා නිවැරදි සැලසුම් සැකසීම හා ඒවාට අනුව ක්‍රියාත්මක වීම
- ★ ප්‍රවීණයන්ගෙන් අවශ්‍ය උපදෙස් සහ මඟ පෙන්වීම් ලබාගැනීම
- ★ ගනුදෙනු නිවැරදි ව වාර්තා කිරීම
- ★ බාහිර පරිසරයේ ඇතිවන වෙනස්කම් හඳුනාගැනීම හා අවශ්‍ය ප්‍රතිචාර දැක්වීම
- ★ ව්‍යාපාරිකයාගේ පෞද්ගලික ජීවිතය ව්‍යාපාර කටයුතුවලින් වෙන් කොට තැබීම
- ★ වෙළෙඳපොල පහසුකම්, ණය පහසුකම්, පර්යේෂණ කටයුතු ආදී කාර්යය සඳහා උදව් වන රාජ්‍ය ආයතනවල සහය ලබාගැනීම
- ★ යහපත් මානව සම්බන්ධතා පවත්වාගැනීම

(iii) අයිතිකරුගේ භූමිකාව

කළමනාකරුගේ භූමිකාව

නායකයාගේ භූමිකාව

(iv) **අයිතිකරුගේ භූමිකාව**

ව්‍යවසායකයෙකු ව්‍යාපාරයේ අරමුණු හා පරමාර්ථ ළඟා කරගැනීම පිණිස අවශ්‍ය සම්පත් සැපයීම, අවදානම් දැරීම, වැදගත් තීරණ ගැනීම ආදී කාර්යය ඉටු කිරීම අයිතිකරුගේ භූමිකාව වේ.

**කාර්යයන්** :- ව්‍යාපාරයට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම

ලාභ / පාඩු විඳ දරාගැනීම

**ඉහත ආකාරයට කළමනාකරුගේ භූමිකාව සහ නායකයාගේ භූමිකාව පැහැදිලි කර ඇත්නම් මුළු ලකුණු හිමි වේ.**

(v)
- තාක්ෂණික කුසලතා
- මානව කුසලතා
- සංකල්පනාත්මක කුසලතා
- කණ්ඩායමක් සමඟ කටයුතු කිරීමේ කුසලතා
- සන්නිවේදන කුසලතා
- උපදේශන කුසලතා
- ආදර්ශමත් ව කටයුතු කිරීමේ කුසලතා

} **මෙයින් ඕනෑම කරුණු 03 ක් පැහැදිලි කළ යුතු ය.**

03. (i) පරිසරයේ ඇති ව්‍යාපාර අවස්ථා හඳුනාගෙන අවදානම් දරමින්, නිර්මාණශීලිත්වය තුළින් නවෝත්පාදන බිහි කිරීමෙහි යෙදෙන මිනිස් චින්තනය හා සම්බන්ධ වූ ක්‍රියාවලියකි.

(ii)

| | | | | |
|---|---|---|---|---|
| භූමිය | - | උදා | : | ඉඩම්, වනාන්තර, පස |
| ශ්‍රමය | - | උදා | : | ඉංජිනේරුවෙකුගේ ශ්‍රමය, වඩු කාර්මිකයෙකුගේ ශ්‍රමය |
| ප්‍රාග්ධනය | - | උදා | : | ගොඩනැගිලි, යන්ත්‍ර සූත්‍ර |
| ව්‍යවසායකත්වය | - | උදා | : | සංවිධානය, මෙහෙයවීම, පරිපාලනය |

(iii) නිර්මාණශීලිත්වය
අවදානම් භාරගැනීම
අනාගත දැක්ම
සුභවාදී වීම
නවෝත්පාදනය
පරිසර සංවේදී බව
අවස්ථා හඳුනා ගැනීම

(iv) විශ්වාස හා ආකල්ප කෙරෙහි තදබල ලෙස ගැලී සිටීම
යම් ගැටලුවකට එකම විසඳුමක් පමණක් ඇතැයි සිතීම
ක්ෂණික ප්‍රතිඵල අපේක්ෂා කිරීම
තර්කානුකූල පදනමක පිහිටා කටයුතු නොකිරීම
ප්‍රායෝගික වීමට බාධා ඇතැයි සිතීම

(v) විවිධත්වය ග්‍රහණය කරගැනීම
අසාර්ථකත්වය ඉවසීම
කුතුහලය දිරිමත් කිරීම
ගැටලු අභියෝග ලෙස දැකීම
නිර්මාණශීලි පුහුණු අවස්ථා

04. (i) ව්‍යාපෘතියේ නම
ඉලක්කගත පාරිභෝගිකයන්
අපේක්ෂිත ඉල්ලුම හා සැපයුම
නිෂ්පාදිතයේ මිල
නිෂ්පාදන ක්‍රියාවලිය
පරිපාලන ව්‍යුහය
ආදී

(ii) ව්‍යාපාර අදහස පැහැදිලි කිරීමට
ව්‍යාපාරය සඳහා මඟ පෙන්වීමට
ව්‍යාපාර පරිසරය පිළිබඳ ව අවබෝධ කරගැනීමට
ව්‍යාපාරයේ අනාගත දිශාව පෙන්වා දීමට ආදී කරුණු

(iii) පාරිභෝගිකයන්ට ප්‍රශ්නාවලි ලබාදී පිළිතුරු ලබාගැනීම
පාරිභෝගිකයන් සමඟ සම්මුඛ සාකච්ඡා කිරීම
වෙළෙඳපොල තුළ පාරිභෝගිකයන් ගනුදෙනු කරන ආකාරය නිරීක්ෂණය කිරීම
පුවත්පත්, සඟරා, වාර්තා, අන්තර්ජාලය වැනි මූලාශ්‍ර

(iv) ස්වකීය භාණ්ඩය හෝ සේවාව සඳහා ඇති ඉල්ලුම

ඉලක්කගත පාරිභෝගිකයා

තරඟකරුවන්

(v) රූපවාහිනිය, ගුවන් විදුලිය, පුවත්පත්, බැනර් ආදිය

නව තාක්ෂණය භාවිතයෙන් අන්තර්ජාල වෙබ් අඩවි, මුහුණු පොත

ජංගම දුරකථන මඟින් කෙටි පණිවිඩ සේවාව

ගැණුම්කරුවන් පෞද්ගලික ව මුණ ගැසී භාණ්ඩ හෝ සේවා ඉදිරිපත් කිරීම ආදී

05. (i) කිසියම් අපේක්ෂිත නිෂ්පාදන ඒකක ප්‍රමාණයක් සඳහා දැරීමට සිදුවන පිරිවැය ඇස්තමේන්තු කර පිළියෙල කරනු ලබන ලේඛනයයි.

(ii) නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා නැවත නැවත දිගුකාලීන ව භාවිතා කරන යන්ත්‍ර සූත්‍ර, ගොඩනැගිලි, උපකරණ වැනි දේ.

(iii)

| අයිතමය | මාසික අවශ්‍යතාවය | ඒකක මිල | මුළු වියදම |
|---|---|---|---|
| පිටි | මිටි 20 | 4 500.00 | 90 000.00 |
| සීනි | මිටි 04 | 5 000.00 | 20 000.00 |
| යීස්ට් | 20 kg | 120.00 | 2 400.00 |
| පොල්තෙල් | 20 L | 280.00 | 5 600.00 |
| ජලය | | | 30 000.00 |
| විදුලිය | | | 40 000.00 |
| දර | | | 18 000.00 |
| නඩත්තු වියදම් | | | 15 000.00 |
| පුහුණු ශ්‍රමිකයාගේ මාසික වැටුප | | | 20 000.00 |
| නුපුහුණු ශ්‍රමිකයාගේ මාසික වැටුප | | | 15 000.00 |
| යන්ත්‍ර ක්ෂය | | | 2 000.00 |
| මුළු නිෂ්පාදන පිරිවැය | | | 258 000.00 |

(iv) ඒකක නිෂ්පාදන පිරිවැය $= \frac{258\ 000.00}{6\ 000.00}$

$=$ රු. 43

06. (i) ★ ව්‍යාපාරය ආරම්භ කිරීමට පෙර කාර්යයන් හා වියදම්

★ මුළු ආයෝජන ඇස්තමේන්තුව

★ අපේක්ෂිත මුදල් ගලා ඒම් හා මුදල් ගලා යාම් ලේඛනය

★ ව්‍යාපාර ප්‍රතිඵල ගණනය

(ii) ★ ව්‍යාපාරයට අවශ්‍ය වන අරමුදල් ප්‍රමාණය නිගමන කරගැනීම

★ මූල්‍ය ගැටළු අවම කරගැනීමට

★ ව්‍යාපාර ලාභය දැනගැනීමට

★ ප්‍රතිඵල ප්‍රමාණවත් ද යන්න ඇගයීමට

(iii)

| **<u>මුදල් ගලා ඒම්</u>** | **<u>මුදල් ගලා යාම්</u>** |
|---|---|
| ★ අයිතිකරුගේ ප්‍රාග්ධනය | ★ වත්කම් මිලට ගැනීම |
| ★ ණය මුදල් ලබාගැනීම | ★ අමුද්‍රව්‍ය හා වෙළෙඳ භාණ්ඩ තොග මිලට ගැනීම |
| ★ විකුණුම් සඳහා මුදල් ලැබීම | ★ වියදම් ගෙවීම |
| ★ ණයගැතියන්ගෙන් මුදල් ලැබීම | ★ ණයහිමියන්ට මුදල් ගෙවීම |
| ★ වත්කම් කුලියට දීමේ ආදායම් | ★ ණය වාරික හා පොළී ගෙවීම |
| ★ ආයෝජන ආදායම් හා පොළී ආදායම් | ★ බදු ගෙවීම |

(iv) (අ) ව්‍යාපාරයක අපේක්ෂිත ආදායම් හා වියදම් සැලකිල්ලට ගෙන ව්‍යාපාරයක් අවසානයේ අත්පත් කරගන්නා ලාභය වර්තමානයේ ගණනය කිරීමයි.

(ආ) ඇස්තමේන්තුගත ආදායම් ප්‍රකාශය

(v)

| | රු. | රු. |
|---|---|---|
| අපේක්ෂිත විකුණුම් ආදායම | | 3 800 000 |
| අඩු කළා : නිෂ්පාදන පිරිවැය | | |
| අමුද්‍රව්‍ය | 820 000 | |
| ශ්‍රම | 660 000 | |
| වෙනත් | 420 000 | 1 700 000 |
| අඩු කළා : නිෂ්පාදන නොවන පිරිවැය | | |
| අලෙවි වියදම් | 90 000 | |
| පරිපාලන වියදම් | 65 000 | |
| මූල්‍ය වියදම් | 35 000 | 190 000 |
| ශුද්ධ ලාභය | | 1 910 000 |

07. (i) පොදු අරමුණක් පැවතීම

සීමිත සම්පත් භාවිතය

සාමූහික සම්බන්ධතාවක් පැවතීම

ආර්ථික කටයුත්තක නියැලීම

පුද්ගල කණ්ඩායමක් ඒකරාශී වී සිටීම

(ii) හවුල්කරුවන් ප්‍රාග්ධනය සපයන ආකාරය

හවුල්කරුවන් ලාභ පාඩු බෙදාගන්නා ආකාරය

හවුල්කරුවන් ව්‍යාපාරයේ කටයුතුවලට දායකවන ආකාරය

හවුල්කරුවන්ගේ වැටුප් ලබාගැනීම

හවුල්කරුවන්ගේ යුතුකම් හා අයිතිවාසිකම්

හවුල් ව්‍යාපාරයේ කටයුතු අවසන් කිරීම සම්බන්ධ තොරතුරු

ප්‍රාග්ධනයට අමතර ව හවුල්කරුවන් සපයනු ලබන ණය සඳහා පොළී ගෙවීම

හවුල් ව්‍යාපාරය පවත්වාගෙන යාම සම්බන්ධයෙන් වෙනත් පොදු එකඟතා

(iii) කොටස් විකිණීමෙන් ප්‍රාග්ධනය රැස් කරගැනීම

අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් කළමනාකරණය වීම

නෛතික පුද්ගලභාවයක් හිමි වීම

අඛණ්ඩ පැවැත්ම

ගිණුම් තැබීම හා විගණනය අනිවාර්ය වීම

(iv) විරැකියාවට විසඳුමක් වීම

ආර්ථික වර්ධනයක් ළඟා කරගත යුතු වීම

භාවිත නොවන සම්පත් සුලභ ව තිබීම

නව රැකියා නිර්මාණය කරන්නන් බිහි කරගත යුතු වීම

ආදායම් බෙදී යාමේ විෂමතාව අවම කළ යුතු වීම

(v) උපදේශන සේවා

තාක්ෂණික සේවා

වෙළෙඳපොල පහසුකම්

***